# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,509- 2007 අගෝස්තු 03 වැනි සිකුරාදා - 2007.08.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 716 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 716 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... .. | 717 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 718 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගෝස්තු මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූලි මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 302

DVF/RECT/262(iii) AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිළධාරී 2006 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් අත්ජානිගොඩ විදාන ආරච්චිගේ සරත් සිරිවර්ධන ශ්‍රීලකාභ (නි/2617)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 දින,
කොළඹ දී ය.

08-212

# වෙනත් පත්කිරීම් ආදිය

2007 අංක 303

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්කිරීම්**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ ජී. ඒ. එස්. ඔබේසේකර මහත්මිය 2007.03.12 දින සිට නැවත නියමයක් කරන තුරු සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ අයි. එන්. වීරසේකර මෙනවිය 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු බස්නාහිර පළාත් සභාවේ කොළඹ මහනගර සභාවේ සහකාර නාගරික ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඕ. කේ. විජේවික්‍රම මෙනවිය 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ජී. ඩී. එල්. යූ. කුමාරි මෙනවිය 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ කේ. එච්. ඩබ්. කරුණාරත්න මිය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ බී. වසන්තන් මයා 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඒ. එස්. සිසිර කුමාර මයා 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එස්. කේ. එම්. කේ. ද අල්විස් මෙනවිය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එම්. කේ. පෙරේරා මිය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එස්. සුදර්ශන් මයා 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එන්. චන්ද්‍රහසන් මයා 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඒ. එල්. එල්. කුලවංශ මෙය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එම්. එම්. කේ. ඩී. වල්පොල මිය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ කේ. එස්. දිල්හානි මිය 2007.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඩී. ඩී. එස්. ජයවර්ධන මයා 2007.01.29 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ II ශ්‍රේණිය ආර්. ඒ. ඩී. එස්. රණතුංග මයා 2007.02.02 දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඩබ්. අබේවර්ණ මයා 2007.03.05 දින සිට නැවත නියමයක් කරන තුරු විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ වයලට් ප්‍රනාන්දු මහත්මිය 2007.03.05 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ එච්. ආර්. ජයරත්න මයා 2007.03.05 දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ යූ. එම්. සී. ශ්‍රියාලතා මෙනවිය 2007.03.05 දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් වශයෙන්

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2007 ජූලි මස 16 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
08-79

# ආණ්ඩුවේ නිවේදන

## වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මහඑළිය කන්න රැස්වීම් වාර්තාව
2007.06.07 වැනි දින

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඑළිය ව්‍යාපාරයේ 2007 යල කන්නය සඳහා කන්න රැස්වීම 2007.06.07 වැනි දින පවත්වන ලදී. එහිදී පහත සඳහන් තීරණ ගන්නා ලදී.

1. *ඇලවේලි සුද්ධ කිරීම*

   2007.06.17 දිනට ඇලවේලි සුද්ධ කිරීම කළ යුතුය. ඇලවේලි සුද්ධ කිරීම හා නඩත්තුව සඳහා සහාය නොදක්වන ගොවීන්ගෙන් දඩ මුදල බඹයකට රුපියල් 400 බැගින් අය කළ යුතු බවට තීරණය විය.

2. *වගා කිරීමට යෝජිත අක්කර ප්‍රමාණය*

   අක්කර 540කි. මෙයින් අර්තාපල් වගාව සඳහා අක්කර 350ක් ද, මිශ්‍ර බෝග (එළවළු) අක්කර 190ක් ද ලෙස ගණනය කර ඇත.

3. *ජලය මුල්වරට නිකුත් කරන දිනය*

   2007.06.20 දින වේ.

4. *කන්නයේ අවසානයට ජලය නිකුත් කරන දිනය*

   2007.11.30 දින වේ.

5. *තවාන් දැමීම හා බෝග වගාව අවසන් කළ යුතු දිනය*

   2007.07.31

6. *පිටපොල යායේ බෝග වගා කර අස්වැන්න ඉවත් කළ යුතු අවසන් දිනය*

   2007.11.30

*යාය නියෝජිතයන් පත් කිරීම*

| | |
|---|---|
| කැටකැල්ල යාය | ඩී. ඒ. ඇම්. සුදුබණ්ඩා මහතා |
| පුරන්වෙල යාය | ඩබ්. එම්. ජයසේකර මහතා |
| හීන් ඇලයාය | ආර්. එම්. චන්ද්‍රාස මහතා |
| තැන්නවත්ත යාය | එම්. ඒ. පියසේන මහතා |
| පිටපොල යාය | එන්. ඒ. චන්ද්‍රකුමාර මහතා |
| හීන්නාරන්ගොල්ල යාය | ඩී. ඒ. ආර්. ඒ. වික්‍රමසූරිය මහතා |
| කිරිබණ්ඩියා උල්පත යාය | ආර්. අප්පුසිංඤෝ මහතා |
| උඩලයාය | ඩී. පී. ගුණපාල මහතා |
| තැන්නවත්ත යාය | ඩී. පී. වික්‍රමසූරිය මහතා (හීන්නාරන්ගොල්ල) |

කෙත් ඇලවල් වල ඉවුර අඩි 03ක් පමණ තිබිය යුතු බවටත්, එසේ නොතබා ඉවුරට හානි කරන ගොවීන්ට නිත්‍යානුකූලව නඩු පැවරීමට තීරණය විය.

අනවසර බට හා වක්කඩ ඉවත් කිරීම

අනවසරයෙන් බට යොදා ජලය ලබාගන්නා ගොවීන්ට නිත්‍යානුකූල පියවර ගැනීමට තීරණය විය. ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීමට යෝජනා සම්මතයක් ඇති කර ගන්නා ලදී.

ඩබ්. එම්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2007 ජූලි මස 01 වෙනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-83

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව (331)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006 නොවැම්බර් මස 17 වන දින පැවැති රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස් අබේරත්න විසින් සහතික කරන ලද අංක 1239 හා 2004.02.18 දින දරන උකස් බැඳුම්කරය මත නියමිත ගෙවීම් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කරන ලද සහ කොළඹ 13, කේ. සිරිල්. සී පෙරේරා මාවත අංක 283 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති කොබෝෂු කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නැමැති සමාගමක් විසින් පැහැර හැර ඇති බැවින් අංක 1239 දරන එකී බැඳුම්කරය මත රුපියල් හැට හය ලක්ෂ හැත්තෑ හත් දහස් පන්සිය හතලිස් හතරයි ශත හතලිස් හතරක් (රු.6,677,554.44) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් හැට හය ලක්ෂ හැත්තෑ හත් දහස් පන්සිය හතලිස් හතරයි ශත හතලිස් හතරක්(රු.6,677,554.44) වන මුදල සහ 2005.03.23 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හැට හය ලක්ෂ හැත්තෑ හත් දහස් පන්සිය හතලිස් හතරයි ශත හතලිස් හතරක් (රු.6,677,554.44) වන මුදල සඳහා වර්ෂයකට (සියයට දහ අටයි දශම හතයි පහ) 18.75% බැගින් තවදුරටත් පොලිය ද, විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තුද, එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේනම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 1239 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කරන ලද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තරය

| *අංකය* | *සංකේත අංකය* | *අයිතමය* | *යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව* | *තත්ත්වය* | *ඒකක සඳහා තක්සේරුව* | *මුළු තක්සේරුව* |
|---|---|---|---|---|---|---|
| 1 | B/D/C/M1TO 50 | දියමන්ති කපන මැෂින් සම්පූර්ණ කට්ටලය | 50 | වැඩකරන තත්ත්වය | 106,000 | 5,300,000 |
| 2 | B/O/D/M1 TO 2 | O/D මැෂින් | 2 | එම | 250,000 | 500,000 |
| 3 | B/D/BM/1 TO 16 | බෲටින් මැෂින් විද්ස්ටික් සහිත | 16 | එම | 187,500 | 3,000,000 |
| 4 | B/D/M/M | යන්ත්‍රෝපකරණ නඩත්තු සම්පූර්ණ කට්ටලය<br>ස්කෝරිං මැෂින් 1<br>රබින් මැෂින් 1<br>පොයින්ටින් මැෂින් 1<br>බැලන්සිං මැෂින් 1<br>ලේත් මැෂින් 1 | කට්ටල 1 යි | එම | 250,000 | 250,000 |
| 5 | B/D/W/P 1-1 | වෙල්ඩින් යන්ත්‍රය 190 ඒම්ප් (ටෙල්වින්) | 1 | එම | 25,000 | 25,000 |
| 6 | B/D/T/E | ටැන්ග්ස් එක්ස්ට්‍රා | 39 | එම | 5,000 | 195,000 |
| 7 | B/D/T/L 1-7 | මේස ලාම්පුව (ඩේසර්) | 7 | එම | 9,000 | 63,000 |
| 8 | B/D/S/T | සිවිස් ටර්බෝ(පාවිච්චි කල) | 11 | එම | 5,000 | 55,000 |
| 9 | B/D/S/D 1-16 | සිවිස් - ඩයමන්ඩ් (පාවිච්චි කල) | 16 | එම | 7,500 | 120,000 |
| 10 | B/D/S/D 1-16 | සිවිස් ඩයමන්ඩ් (අලුත්) | 34 | එම | 20,000 | 680,000 |
| 11 | B/D/B/P 1-1 | උණුකරන යන්ත්‍රය | 01 | එම | 10,000 | 10,000 |
| 12 | B/D/JA 1-2 | ජැක් | 02 | එම | 2,500 | 5,000 |

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | තත්ත්වය | ඒකක සඳහා තක්සේරුව | මුළු තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| 13 | B/DSC 1-1 | තරාදි (සැටොරියස්) 1500 Cts. | 1 | එම | 90,000 | 90,000 |
| 14 | B/DSC 1-2 | තරාදි (සැටොරියස්) 1500 Cts. | 2 | එම | 45,000 | 90,000 |
| 15 | B/DSC 1-1 | තරාදි (ඒඑම්ඩි) 1500 Cts. | 1 | එම | 100,000 | 100,000 |
| 16 | B/D/P/S 1-1 | පොලිතීන් ඇවුරුම් උපකරණය | 1 | එම | 2,000 | 2,000 |
| ඩයමන්ඩ් උපකරණ තක්සේරුව | | | | | | 10,485,000 |
| 1 | B/L/F/M 1-147 | ෆැෂටින් යන්ත්‍රය (ඩබල් හැන්ඩ්) | 147 | එම | 47,000 | 6,909,000 |
| 2 | B/L/F/M 1-46 | ෆැෂටින් මැෂින් (තනි) | 46 | එම | 30,000 | 1,380,000 |
| 3 | B/L/F/M 1-20 | ෆැෂටින් මැෂින් (තනි Fac 8) | 20 | එම | 15,000 | 300,000 |
| 4 | B/L/F/M 1-37 | ෆැෂටින් මැෂින් (ඩබල්) | 37 | එම | 15,000 | 555,000 |
| 5 | B/L/C/M 1-1 | ෆැෂටින් මැෂින් (ඩබල් 10- කී) | 01 | හොඳයි | 35,000 | 35,000 |
| 6 | B/L/C/M 1-3 | ක්‍රමාංකන යන්ත්‍රය (අතින් වැඩකරන) | 03 | හොඳයි | 15,000 | 45,000 |
| 7 | B/L/C/M 1-7 | කැලිබ්‍රේෂන් මැෂින් | 07 | වැඩකරන තත්ත්වය | 40,000 | 280,000 |
| 8 | B/L/C/M 1-5 | කැලිබ්‍රේෂන් මැෂින් (අර්ධ ස්වයංක්‍රීය) | 05 | එම | 80,000 | 400,000 |
| 9 | B/L/G/M 1-2 | ඇඹරුම් යන්ත්‍රය | 02 | හොඳයි | 5,000 | 10,000 |
| 10 | B/L/S/M 1-14 | මහන මැෂිම | 14 | හොඳයි | 15,000 | 210,000 |
| 11 | B/L/S/H/M 1-2 | මහන මැෂිම(ද්විත්ව) | 02 | වැඩකරන තත්ත්වය | 18,000 | 36,000 |
| 12 | B/L/T/U/M | ටම්බ්ලින් මැෂිම | 01 | එම | 25,000 | 25,000 |
| 13 | B/L/P/M 1-7 | පර්පෝමින් මැෂින් (ද්විත්ව) | 07 | වැඩකරන තත්ත්වය | 10,000 | 70,000 |
| 14 | B/TR/ST 1-2 | ස්ටොප්සෝන් ට්‍රාන්පෝර්මර් | 02 | එම | 3,500 | 7,000 |
| 15 | B/F/EX | 1. ශුන්‍ය කාරක විදුලි පංකා 18″<br>2. ශුන්‍ය කාරක විදුලි පංකා 12″<br>3. ශුන්‍ය කාරක විදුලි පංකා එම | 01<br>01<br>01 | හොඳයි<br>හොඳයි<br>හොඳයි | 1,250<br>1,000<br>1,000 | 1,250<br>1,000<br>1,000 |
| 16 | B/B/G1-4 | ගෑස් ලිප (බර්නර්) | 06 | පිළිගතහැකි | 250 | 1,500 |
| 17 | B/P/A 1-4 | වායු දවනය | 04 | එම | 500 | 2,000 |
| 18 | B/M/E 1-12 | විදුලි මෝටරය 1/2 H. P. | 12 | වැඩ කරන | 1,500 | 18,000 |
| 19 | B/M/E/CA 1-2 | ක්‍රමාංකණ යන්ත්‍ර මෝටරය 1/2 H. P. | 02 | එම | 1,500 | 3,000 |
| 20 | B/F/S/M 1-2 | සීලින් ෆෑන් මෝටරය | 02 | හොඳයි | 300 | 600 |
| 21 | B/B/V 1-1 | බෙන්ච් වයිස් | 01 | එම | 750 | 750 |
| 22 | B/D/B 1-164000 | පිත්තල ඩොප් ස්ටික් මි. මී. 8 | 164,000 | එම | 18 | 2,952,000 |

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | තත්ත්වය | ඒකක සඳහා තක්සේරුව | මුළු තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| 23 | B/D/A 1-3200 | ඇලුමිනියම් ඩොප් ස්ටික් | 3200 | හොඳයි | 4 | 12,800 |
| 24 | B/CA/DI 1-2 | ඇල්ෆා විද් තරාදිය ග්‍රෑම් 500 | 2 | වැඩ කරන තත්ත්වය | 20,000 | 40,000 |
| 25 | B/CA/DIA 1-2 | ඩිජිටල් කැලිපර් | 2 | හොඳයි | 6,500 | 13,000 |
| 26 | B/CA/DIA 1-8 | ඩයල් කැලිපර් | 8 | එම | 3,500 | 28,000 |
| 27 | B/T/W | දැව මැෂින් මේසය | | | | |
| | | 1. 13′ x 4′ (5x2) | 1 | එම | 7,000 | 7,000 |
| | | 2. 7′ x 2′ (3 x 1) | 1 | එම | 6,000 | 6,000 |
| | | 3 45′ x 2′ (2 x1) | 1 | එම | 55,500 | 55,500 |
| | | 4. 12′ x 14′ ( 4 x 2) | 1 | එම | 6,000 | 6,000 |
| | | 5. 3′ x 3′ | 1 | එම | 3,000 | 3,000 |
| | | 6. 2′ x 3′ | 1 | පිළිගතහැකි | 2,000 | 2,000 |
| 28 | BT/M/FO 1-2 | මැෂින් මේසය ෆෝමිකා මතුපිට | 2 | එම | 6,000 | 12,000 |
| 29 | B/B/W 1-10 | දැව බංකු | 10 | එම | 500 | 5,000 |
| 30 | B/CU/W | දැව කබඩ් | | | | |
| | | 1. 3′ x 4.5′ x 1.5 | 01 | හොඳයි | 2,500 | 2,500 |
| | | 2. 4′ x 4′ 1.5 | 01 | හොඳයි | 3,000 | 3,000 |
| | | 3. 3′ x 4′ 1.5 | 03 | පිළිගතහැකි | 600 | 1,800 |
| 31 | B/T/DO 1-1 | ඩොපින් මේසය 2.5′ x 3′ | 01 | පිළිගතහැකි | 1,200 | 1,200 |
| 32 | B/T/CI 1-2 | ලිපිකරු මේසය | 02 | පිළිගතහැකි | 1,500 | 3,000 |
| 33 | B/D/RA 1-1 | ඩොප් ස්ටික් පැක් 5′ x 4.5′ | 01 | හොඳයි | 2,750 | 2,750 |
| 34 | B/T/1 1-1 | පරීක්ෂණ මේසය 3′ x 3′ | 01 | හොඳයි | 2,750 | 2,750 |
| 35 | B/CH/W/C A 1-4 | දැව සහිත වේවැල් පුටුව | 04 | හොඳයි | 600 | 2,400 |
| 36 | B/CH/W 1-3 | දැව පුටුව | 03 | හොඳයි | 500 | 1,500 |
| 37 | B/D/WCJ 1-1 | දැව ලාච්චු කබඩ් එක 2.75′ x 3′ x 1.25′ | 01 | හොඳයි | 1,500 | 1,500 |
| 38 | B/CA/FI 1-1 | ලිපිගොණු කැබිනෙට්ටුව (වානේ) | 01 | හොඳයි | 3,000 | 3,000 |
| 39 | B/SA/IR -1 | යකඩ සෙප්පුව 4′ x 2′ x 2.25′ | 01 | හොඳයි | 45,000 | 45,000 |
| 40 | B/F/SE 1-72 | සීලිං විදුලි පංකාව | 72 | හොඳයි | 1,250 | 90,000 |
| 41 | B/F/T 1-4 | මේස විදුලි පංකාව | 04 | හොඳයි | 800 | 3,200 |
| 42 | B/F/PD 1-1 | පෙඩස්ටල් විදුලි පංකාව | 01 | හොඳයි | 2,500 | 2,500 |
| 43 | B/T/L | ටියුබ් ලයිට් ෆිටින් | | | | |
| | | 1. අඩි 2 යි | 21 | හොඳයි | 100 | 2,100 |
| | | 2. අඩි 4 යි | 13 | හොඳයි | 150 | 1,950 |
| 44 | B/CY/G 1-4 | ගෑස් සිලින්ඩරය | 04 | හොඳයි | 2,500 | 10,000 |
| 45 | B/G/H 1-1 | අතින් වැඩ කරන ඇඹරුම් යන්ත්‍රය | 01 | හොඳයි | 750 | 750 |

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | තත්ත්වය | ඒකක සඳහා තක්සේරුව | මුළු තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| 46 | B/L/T 1-3 | මේස ලාම්පුව | 02 | හොඳයි | 300 | 600 |
| 47 | B/ST/W 1-40 | දැව ආයුධ | 40 | හොඳයි | 400 | 16,000 |
| | | ලැපිඩරි යන්ත්‍ර තක්සේරුව | | | | 13,630,900 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය - 01)

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-153

---

## මහජන බැංකුව- ලකී ප්ලාසා ශාඛාව (331)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2007 ජනවාරි 26 වන දින පැවැති රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 1240 හා 2004.02.18 වන දින දරන උකස් බැඳුම්කරය මත නියමිත ගෙවීම් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කරන ලද සහ කොළඹ 13, කේ. සිරිල් සී. පෙරේරා මාවත අංක 283 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති කොබෝෂු කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නැමැති සමාගමක් විසින් පැහැර හැර ඇති බැවින් අංක 1240 දරන එකී බැඳුම්කර මත රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ අනූනව දහස් හැටයි ශත අනූවක් (රු.12,999,060.90) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ අනූනව දහස් හැටයි ශත අනූවක් (රු.12,999,060.90)වන මුදල සහ විකිණීමේ දිනය තෙක් රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ අනූනව දහස් හැටයි ශත අනූවක් (රු. 12,999,060.90) වන මුදල සඳහා වර්ෂයකට 18.75% බැගින් 2005.09.01 දින සිට තවදුරටත් පොලියද, විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද, එදිනතෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේනම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 1240 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කරන ලද දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහ පළාත කෝරළේ, කැබිල්ලවෙල ගමේ පිහිටි උතුරට : ලොට් අංක 586 හා 521 එම් දරන කැබලි, නැගෙනහිරට : ලොට් අංක 521 දරන කැබැල්ල ද, දකුණට : අංක 521 හා 210 දරන කැබලි සහ බස්නාහිරට : අංක 210, 521 හා 586 දරන කැබලි මායිම් වන බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ. 135/38 යටතේ ලියාපදිංචි කරන ලද සර්වේයර් ජනරාල් විසින් සාදන ලද හා සර්වේයර් ජනරාල් සන්තකයේ ඇති අංක 46 (සැළසුම් අංක 0/බී49) දරන කේෂත්‍ර සටහනේ දක්වා ඇති අංක 33 දරන අවසාන ගම් පිඹුර ප්‍රකාර හෙක්ටෙයාර් දශම හයයි පහක් (හෙක්. 0.650) විශාල බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කට්ටිය හා එහි පිහිටි සියලුම දේත් සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය - 01)

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය -01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-154

## මහජන බැංකුව - වත්තල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2002.12.05 දිනැති අංක. 7604 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වික්‍රමසිංහ ආරච්චිගේ දෝන මේරි ප්‍රින්ට්රෝස් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් පන්සියතුනයි ශත අනූව (රු.252,503.90) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.07.01 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් පන්සියතුනයි ශත අනූව (රු.252,503.90) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් පන්සියතුනයි ශත අනූව (රු.252,503.90) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ.එස්. රාමනායක විසින් එකී අංක 7604 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභාවේ කඳාන සීමාව තුල නාගොඩ පිහිටි ඕවිටට යාබද මිල්ලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. ඩී. සී. පෙරේරා (වඩාත් නිවැරදි ලෙස ඩී. ඩී. සී. ඒ. පෙරේරා) විසින් 2000.02.21 වන දින මැන සකස් කළ අංක 1827 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසට මායිම් : උතුරට : ප්‍රාදේශීය සභා පාරද, නැගෙනහිරට : ඩී. සුනිල් ටෙනිසන් පෙරේරාට අයත් ඉඩමද, දකුණට : ඩී. සුනිල් ටෙනිසන් පෙරේරාට අයත් ඉඩම ද, බස්නාහිරට : ශාන්ත ජෝන් මාවත ද යන මායිම් තුල පිහිටි පර්චස් හයයි දශම දෙකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 6.20) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී.459/101 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටසේ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-155

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 139372 සහ 162171.

2007 අප්‍රේල් මස 04 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද 2002 අගෝස්තු මස 27 වැනි දින අංක 979 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමින් වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොඹගොඩ ලියනගේ රංජිත් වසන්ත ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම). එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් සහතික කරන ලද 2003 ජුනි මස 10 වැනි දින හා අංක 580 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොඹගොඩ ලියනගේ රංජිත් වසන්ත ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම).

ඉහත කී බැඳුම්කර යටතේ රුපියල් තිස් නව ලක්ෂ විසිහත් දහස් විසිතුනයි ශත අනූහයක (රු. 39,27,723.96) මුදලක් 2006 ඔක්කෝබර් මස 10 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තිස් නව ලක්ෂ විසිහත් දහස් හත්සිය විසිතුනයි ශත අනූහයක (රු. 39,27,723.96) මුදලට 2006 ඔක්තෝබර් මස 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,00,000 මුදල මත 13.11% බැගින් වැඩිදුර වාර්ෂික පොලියක් සහ, රු. 16,74,215.46 ක මුදල මස 16% වැඩිදුර වාර්ෂික පොලියක් ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 979 සහ 580 දරන උකස් බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් වෙත උකස්කර ඇත්තා වූ ද, මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රයන් කොළඹ 12, හල්ස්ඩෝර්ප්ස් වීදියේ, අංක 99 හි බලයලත් වෙනදේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔfප් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත කී 1 වන උපලේඛනය

බලයලත් මානක එම්. ඒ. සෙල්වින් ප්‍රේමරත්න විසින් 1984 දෙසැම්බර් මස 06 වැනි දින සාදන ලද අංක 2243 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ කරාගොඩ, නබඩාව සහ යටලමත්ත ග්‍රාමයන් තුල පිහිටි ගොඩනැගිලි සහ වගාවන් සහ සියලුදේත් සමග මහහේන නමින් හැඳින්වෙන කරාගොඩ වතුයායේ ලොට් 1, ලොට්1 ඒ හි ලොට් 1 කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් 1 බී දරන කොටස (ග්‍රාමයේ සිට ඉඩම අතරින් යෑම සඳහා වෙන් කරන ලද ගමන් මාර්ගය හැර) ලොට් 1 බී දරන ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1982 සැප්තැම්බර් මස 15 වන දින සාදන ලද අංක. එච්/704 දරන පිඹුරේ ලොට් 12 ද, නැගෙනහිරට :ලොට් අංක 535 ද, දකුණට : ලොට් 535 සහ 860 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1 ඒ ද, යන මායිම් තුළ අක්කර

දොලහයි රූඩ් 2 ක් (අ. 12, රූ. 2, පර්. 0) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 732/282 වෙළුවේ/පිටුවේ ලියාපදිංචි වී ඇත.

මැතකදී සිදුකරන ලද මිනුම් පිඹුර පරිදි එකී දේපළ මෙසේ විස්තර කර ඇත :

බලයලත් මානක එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2001 ජූලි මස 27 වන දින සාදන ලද අංක 933 දරන පිඹුර පරිදි දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ කරාගොඩ, නබඩාව සහ යටලවත්ත ග්‍රාමයන් තුල පිහිටි ගොඩනැගිලි සහ වගාවන් සහ සියලුදේත් සමග මහහේන නමින් හැඳින්වෙන කරාගොඩ වතුයායේ ලොට්1, ලොට් 1 ඒ හි ලොට් 1 කියන ඉඩමේ වෙන් කරන ලද ලොට් 1 බී කොටස (ග්‍රාමයේ සිට ඉඩම අතරින් යෑම සඳහා වෙන් කරන ලද ගමන් මාර්ගය හැර) ලොට් 1 බී දරන ඉඩමට මායිම් උතුරට : බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1982 සැප්තැම්බර් මස 15 වන දින සාදන ලද අංක. එච්/704 දරන පිඹුරේ ලොට් 12 ද, නැගෙනහිරට :ලොට් අංක 535 ද, දකුණට : ලොට් 535 සහ 860 සහ කරාගොඩ සිට එල්. ආර්. සී. ඉඩමට ඇති පාර ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1 ඒ ද, යන මායිම් තුළ අක්කර දොලහයි රූඩ් 2 ක් (අ. 12, රූ. 2, පර්. 0) විශාල ඉඩම වේ.

### ඉහත කී 2 වන උපලේඛනය

1. බලයලත් මානක එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2001 ජූලි මස 20 වන දින හා 21 වන දින සාදන ලද අංක 933 බී පරිදි දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ යක්තලමුල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ කරාගොඩ, නබඩාව සහ යටමලගල ග්‍රාමයන් තුළ පිහිටි (කරාගොඩ වතුයායේ බෙදන ලද කොටසක් වන) මහහේන කියන ඉඩමේ ලොට් 1 දරන ඉඩමේ නැවත බෙදීමක් වන ලොට් 1ඒ ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩමේ භූමිය ගස කොළ, තේ වගාව, වෙනත් වගාවන් ගොඩනැගිලි සහ එහි ඇති සියලුදේත් සමග ලොට් 1 ඒ දරන ඉඩමට මායිම් උතුරට : . එච්/704 දරන පිඹුරේ පෙන්වා ඇති එම ඉඩමේ ලොට් අංක 02, 16, 06, 17 සහ 12 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1 බී ද, දකුණට :එම ඉඩමේ අංක එච්/094 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 1 බී සහ 1 සී ද, සහ බස්නාහිරට : එච්/ 704 දරන පිඹුරේ පෙන්වා ඇති එම ඉඩමේ (පාරක් සඳහා වෙන්කළ) ලොට් 464, ලොට් 02 සහ ලොට් 16 ද, යන මායිම් තුල අක්කර දොලහයි රූඩ් දෙකක් (අ. 12, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් 05.060 විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 857/184 යටතේ ලියාපදිංචි වී ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, යක්කලමුල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ කරාගොඩ සහ නබඩාව ග්‍රාමයන් හි පිහිටි කරාගොඩ වතුයායේ මහහේන කියන ඉඩමේ භූමිය ගස කොළ, තේ වගාව, ගොඩනැගිලි සහ එහි ඇති සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී දරන ඉඩමට මායිම් උතුරට : . කරාගොඩ ග්‍රාමය ද, (එfප් වීපී 550 හි ලොට් 535) ද, නැගෙනහිරට සහ දකුණට : එfප් වීපී 550 හා 535 ද සහ බස්නාහිරට : එfප් වීපී 639 හි ලොට් 464 සහ එම ඉඩමේ ලොට් "ඒ" හි ද යන මායිම් තුල බලයලත් මානක එච්. එල්. ආර් ජයසුන්දර විසින් 2001 මාර්තු මස 27 සහ 28 යන දිනවල සාදන ලද අංක 933 ඒ දරන පිඹුර පරිදි අක්කර හයයි පර්චස් විසිපහක් (අ. 6, රූ. 0, පර්. 25) හෝ හෙක්ටයාර් 02.492 විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 687/257 යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

08-144

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු
1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ධිශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයඞ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | | තැපැල් ගාස්තුව (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| අගෝස්තු | 2007.08.03 | සිකුරාදා | 2007.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.10 | සිකුරාදා | 2007.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.17 | සිකුරාදා | 2007.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.24 | සිකුරාදා | 2007.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.31 | සිකුරාදා | 2007.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2007.09.07 | සිකුරාදා | 2007.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.14 | සිකුරාදා | 2007.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.21 | සිකුරාදා | 2007.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.28 | සිකුරාදා | 2007.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2007.10.05 | සිකුරාදා | 2007.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.12 | සිකුරාදා | 2007.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.19 | සිකුරාදා | 2007.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.26 | සිකුරාදා | 2007.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.